# ශ්‍රී ලංකාවේ සංචාරක සත්කාරක නිවහන් සංකල්පය, ප්‍රවර්ධනය හා ප්‍රතිලාභ (පදවිගම්පල සංචාරක සත්කාරක නිවහන් ව්‍යාපෘතිය ඇසුරින්)

එම්.වී.ආර්.එම්. සුවිමාලි රත්නායක*

## සංක්ෂේපය

සංචාරක සත්කාරක නිවහනක් යනු සංචාරක නවාතැන් විශේෂයකි. සංචාරකයාට ගමනාන්තයේ දේශීය ජනතාව සමඟ නවාතැන් ගැනීම මෙහිදී සිදුවේ. සංචාරකයා පදවිගම්පල සංචාරක සත්කාරක නිවහන ශ්‍රී ලංකාවේ ප්‍රථම සංචාරක සත්කාරක නිවහන් ගම්මානයයි. මෙම පර්යේෂණය මඟින් සාක්ෂාත් කර ගැනීමට යොමු වූ ප්‍රධාන අරමුණු ත්‍රිත්වය වූයේ සංචාරක සත්කාරක නිවහන් සංකල්පය හඳුනාගැනීම, සංචාරක සත්කාරක නිවහන් ගම්මානය පිළිබඳව හා එහි පවතින විභවතා පිළිබඳව අධ්‍යනය හා සංචාරක සත්කාරක නිවහන් ගම්මාන ව්‍යාපෘතිය මඟින් අධ්‍යයන ප්‍රදේශයට ලැබී ඇති ප්‍රතිලාභ හඳුනාගැනීම ය. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස් කරන ලද්දේ සම්මුඛ සාකච්ඡා හා ක්ෂේත්‍ර නිරීක්ෂණ ක්‍රමවේද උපයෝගී කරගනිමිනි. ද්විතීක දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් සත්කාරක නිවහන් සම්බන්ධව සංචාරක සංවර්ධන අධිකාරියෙන් නිකුත් කළ සඟරා, අන්තර්ජාලය, සබරගමු පළාත් සභාව සතු සැලසුම් ආදිය යොදා ගන්නා ලදි. අධ්‍යයනය අවසානයේ දී ප්‍රවර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කර තිබේ.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවට 2016 වර්ෂයේදී සංචාරකයන් මිලියන 2.5ක් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂාව වී තිබේ. නමුත් එම සංචාරක ක්ෂේත්‍රයේ වර්තමානයේ පවතින හෝටල් කාමර සංඛ්‍යාව එවන් පිරිසක් සඳහා ප්‍රමාණවත් නොවේ. එබැවින් විකල්ප නවාතැන් පහසුකම් වෙත යොමු වීම ක්ෂේත්‍රයේ අවශ්‍යතාවක් වී පවතී. සංචාරක සත්කාරක නිවහන් සංකල්පය සුවිශේෂී වන්නේ සංචාරකයාට වෙනස් ආරක අත්දැකීමක් ලබා දීමට මෙන්ම ප්‍රජාවගේ ඍජු මැදිහත් වීම මත ඔවුන්ට ප්‍රතිලාභ ගැනීමට නිර්මාණය වූ සංකල්පයක් වීමය.

දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ නිර්මාණය වූ මෙම සංකල්පය තුළ දී සබරගමුව පළාත් සභාව විසින් මා ඔය කලාප සංවර්ධන වැඩසටහනේ පියවරක් වශයෙන් පදවිගම්පල නම් ගම්මානය ආශ්‍රිත කරගෙන මෙම සංචාරක සත්කාරක නිවහන් ගම්මාන වැඩසටහන ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ සංචාරක සත්කාරක නිවහන් වැටසටහන් යටතේ විවිධ පළාත්වල එක් එක් නිවාස මේ සඳහා යොදා ගත්තද මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම සංචාරක සත්කාරක නිවහන් ග්‍රාමය වේ. මෙහි දී ප්‍රජා සංචරණය මූලික කරගෙන විවිධ ක්‍රියාකරකම්ද ගම්මානය ආශ්‍රිත කරගෙන ක්‍රියාත්මක කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ජන ප්‍රජාව සමඟ එකට වාසය කරමින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට සංචාරකයාට අවස්ථාව ලැබෙන්නාක් මෙන්ම දේශීය ප්‍රජාව

* තාවකාලික කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, suvimalirathnayake123@gmail.com

සංචාරක කර්මාන්තයේ පාලන ක්‍රියාවලියට, තීරණ ගැනීමට හා පාලනයට යන කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ වී සෘජු ප්‍රතිලාභ ඉන් ලබාගැනීම හේතුවෙන් මෙම සංකල්පය ඉතාමත් වැදගත් වේ.මෙහිදී මෙම සංචාරක සත්කාරක නිවහන් ගම්මානය, එහි පවතින විභවතා, ප්‍රතිලාභ හා එය ප්‍රවර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ගද ඉදිරිපත් කර තිබේ.

**ශ්‍රී ලංකාවේ සංචාරක සත්කාරක නිවහන් සංකල්පය**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්වචනයට අනුව සංචාරක සත්කාරක නිවාසයක් යනු, ශ්‍රී ලාංකික නිවාසයක් තුළ ශ්‍රී ලාංකික වැසියන් සමඟ දේශීය ආහාර පාන, සිරිත් විරිත් හා ආගන්තුක සත්කාර අත් විඳිමින් ශ්‍රී ලංකේය ජීවන රටාව හා සංස්කෘතික වටිනාකම් පිළිබඳව සැබෑ මෙන්ම අගනා අත්දැකීම් ලබමින් දිවයින තුළ නිවාඩුවක් ගත කිරීමට සංචාරකයන් හට ඉඩ සලසා දීම ය. මෙහි අනු බාණ්ඩ 3කි. එනම්,

1. සංචාරක සත්කාරක නිවාස (Home Stay Units)
2. බංගලා (Bunglows)
3. සංචාරක කුලී නිවස හා කුලී නිවාස ඒකක. (Rented Houses or Rented Apartments)

1) සංචාරක සත්කාරක නිවාස.

තමන් පදිංචි නිවස තුළ ඇති කාමරයක් හෝ කාමර කිහිපයක් තුළ සංචාරකයන් හට නවාතැන් පහසුකම් ලබා දී ඔවුන් සමඟ එක්ව ශ්‍රී ලාංකීය දිවි පෙවෙත පිළිබඳව අත්දැකීම ලබා ගැනීමට ඔවුන්ට ඉඩ සලසා දීම.

2) බංගලා

නිවස රැකබලා ගන්නෙකු යොදා අවම ආගන්තුක සේවා පමණක් සපයමින් පවත්වාගෙන යන, කිසිවෙකු පදිංචි නොවූ අංග සම්පූර්ණ නිවාස වේ. මෙහි දී නිවස බලාගන්නා කෙනෙකු, කෝකියෙකු වැනි කෙනෙක් පමණක් සපයා දෙනු ලබයි. වසර 100කට වඩා පැරණි ඉතිහාසයක් හිමි බංගලා උරුම බංගලා (heritage buglows) නමින් හඳුන්වනු ලබයි.

3) සංචාරක කුලී නිවස හා කුලී නිවාස ඒකක.

කිසිඳු සේවාවක් සපයා නොදී කුලී පදනම මත සංචාරකයෙකු සඳහා ලබාදෙනු ලබන ගෘහ භාණ්ඩ සහිත අංග සම්පූර්ණ නිවාස හා නිවාස ඒකක වේ. මෙහිදී සේවා සපයන්නන් ලබා ගැනීමට හෝ නොමැතිව කටයුතු කිරීමට සංචාරකයාට හැකියාව ලැබේ.

(මූලාශ්‍රය:-http://www.sltda.lk/home_stay_project)

මෙම සංචාරක සත්කාරක නිවහන් වැඩසටහන හඳුන්වා දීම මඟින් බලාපොරොත්තු වන්නා වූ අරමුණු කිහිපයක් වේ. එහි දී මූලිකම වශයෙන් බලාපොරොත්තු වන්නේ සංචාරක කර්මාන්තය හා බැඳුණු අවස්ථා තුළ ප්‍රජාවට බලය ලබා දෙමින්, සංචාරක කර්මාන්තය

හරහා ආර්ථික වාසි ඔවුන් වෙත ලඟාකර දීමය. ඊට අමතරව දේශීය ප්‍රජාව සංචාරක කර්මාන්තයේ සම්පත්දායකයන් බවට පත් කර ගැනීම, රූ දෙස් සංචරණය හා ග්‍රාමීය සංචරණයේ තිරසාර හා වගකීම් සහිත සංවර්ධනය, ග්‍රාමීය ප්‍රදේශ වල සංචාරක කර්මාන්තය සම්බන්ධ ක්‍රියාකරකම් පුළුල් කිරීම, ග්‍රාමීය පළාත් වල සංචාරක නවාතැන් පහසුකම් වල ගුණාත්මක බව වැඩිකරගැනීම සඳහා සහයෝගය ලබාදීම යන කාරණා ප්‍රධාන වේ.

**සංචාරක සත්කාරක නිවහනක් සඳහා තිබිය යුතු මූලික අවශ්‍යතා**

සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් සංචාරක සත්කාරක නිවහනක් ලෙසට ලියාපදිංචි වීම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු අංග පිළිබඳව හඳුන්වා දී තිබේ. මෙම අවශ්‍යතා සපුරා ඇත්නම් ඕනෑම අයෙකුට තම නිවස සංචාරක සත්කාරක නිවාසයක් බවට පත්කිරීම උදෙසා ලියාපදිංචි විය හැකිය.

ප්‍රධාන වශයෙන්ම අදාළ ප්‍රදේශය හා නිවසේ පිහිටීමත් සංචාරක සත්කාරක නිවාසයක් සඳහා සුදුසු විය යුතු අතර ඊට සුදුසු ප්‍රවේශ මාර්ගද තිබිය යුතුය. නිවස ඇතුළත හා පිටත මෙන්ම ගෘහ භාණ්ඩ ද මනාව නඩත්තු කර තිබිය යුතු මෙන්ම නිවසේ තත්ත්වය හ ගෙමිදුල ද සංචාරක නිවාසයක් සඳහා සුදුසු විය යුතුය. වාහන නවතා තැබීමේ පහසුකම අත්‍යාවශ්‍ය වේ. මේවා මූලික අවශ්‍යතා වශයෙන් සංචාරක සංවර්ධන අධිකාරිය හඳුන්වා දී ඇති අතර ඊට අමතරව නිදන කාමර, කෑම කාමර, කුස්සිය, නාන කාමර, සාලය සඳහා වූ සුදුසුකම් හා පොදුවේ තිබිය යුතු අවශ්‍යතා මාලාවක් ද හඳුන්වා දී තිබේ. මේ සියලුම ස්ථාන වල පිරිසිදුකම, පිළිවෙල නඩත්තුව ඉතාමත් අත්‍යාවශ්‍ය අංගයකි. ජල පහසුකම්, විදුලිය, ප්‍රමාණවත් ආලෝකය, ප්‍රථමාධාර පහසුකම්, හොඳ ඉඩ කඩක්, කසල බැහැර කිරීමේ ක්‍රියාවලි, විදුලි පංකා ආදී අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම වැදගත් වේ.

ඊට අමතරව අමුත්තන් සඳහා වාර්තා පොතක් නඩත්තු කිරීම ද නිවැසියන් කළ යුතු අතර බිල් පොත් ද පවත්වාගෙන යා යුතුය. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිදන කාමර හා නාන කාමර සඳහා නියමිතව තිබිය යුතු වර්ග ප්‍රමාණයක් ද සඳහන් කර තිබේ. තනි නිදන කාමරයක් අවම වශයෙන් වර්ග අඩි 100ක් හා යුගල නිදන කාමරයක් අවම වශයෙන් වර්ග අඩි 120ක් විය යුතු අතර නාන කාමරයක අවම ප්‍රමාණය වර්ග අඩි 30ක් විය යුතුය.(Registration guideline for home stay accommodation scheme, 2013)

මේ සියලු අවශ්‍යතා සපුරාලීමට හැකිවුවහොත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණ අංශය මඟින් ලියාපදිංචි කිරීමේ අයදුම්පතක් ලබාගෙන ලියාපදිංචි විය හැකිය. ඉන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පරික්ෂා කර බලා අනුමැතිය ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සලකා බැලීම සිදු කරනු ලබයි.

**පදවිගම්පල ගම්මානය හැඳින්වීම**

පදවිගම්පල ගම්මනය පිහිටා ඇත්තේ සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළය. පදවිගම්පල 5ඒ වූ ග්‍රාම නිළධාරි

කොට්ඨාසයට අයත්ය. පදවිගම්පල ගම්මානය කොළඹ සිට කිලෝමීටර 95ක් දුරින් හා රඹුක්කන සිට කිලෝමීටර් 04ක් දුරින් පිහිටා ඇති අතර කොළඹ මහව දුම්රිය මාර්ගය පිහිටා ඇත්තේ ද මෙම ගම්මානය අසලය. මධ්‍යම කඳුකරයේ බටහිර තෙත් කලාපයට අයත් වන බැවින් මෙම ප්‍රදේශයට වාර්ෂිකව මිලිමීටර් 1500-3000 ක් දක්වා පමණ වේ. මෙම පළාතේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 30-40 අතර අගයක් ගනී.(Ma oya zone development master plan,2012)

පදවිගම්පල ගම්මනය ගතානුගතික සමාජයකින්, නානාවිධ නිවර්තන වෘක්ෂලතා, උල්පත්, කුඹුරු, කඳු, කුඩා දිය ඇළි, කෘෂිකාර්මික හා වගාබිම් ආදියෙන් සමන්විත වූ ග්‍රාමීය ප්‍රදේශයකි. ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන මෙම ගම්මනයේ පවුල් 125ක් වෙසෙති. ඔවුන් ප්‍රධාන ආදායම් උපයාගන්නේ කෘෂිකර්මාන්තය මගිනි. වී ගොවිතැනට අමතරව රබර්, කෙසෙල්, කපු, පුවක් යන වගාවන් මගින් ආදයම් උපදවා ගනු ලැබේ . නමුත් ප්‍රධාන ආදායම් උපයාගැනීමේ මාර්ගය වී ගොවිතැනයි. සමහර ගැමියන් විසින් වඩු කාර්මික කටයුතු, උණ හා කොහු නිෂ්පාදන හා රසකැවිලි නිෂ්පාදන කටයුතු සිදු කරනු ලැබේ. තමන්ගේ දෛනික පරිභෝජනය උදෙසා එළවළු හා පළතුරු නිවෙස්වල ම වගා කරගනු ලබන අතර ඉනුත් මුදල් උපයාගනී. රජයේ පෞද්ගලික අංශයේ රැකියා වල නිරතවන්නේ ගැමියන්ගෙන් ඉතා සුළු ප්‍රතිශතයකි.

පදවිගම්පල බොහෝ ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ එහි පිහිටි ගල්මැස්ස හේතු කොටගෙනය. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්මාරකයක් වන මෙම ගල් මැස්ස විජයාගමනයට පෙර ඉදිවූවක් බව සැලකේ. නියොලිතික යුගයේ මානවයා සූර්ය වන්දනයට යොදාගත් ස්ථානයක් වශයෙන් ද සොහොන් ගැබක් වශයෙන් ද විවිධ මත මෙම ගල් මැස්ස වෙනුවෙන් ඉදිරිපත් වී තිබේ. (http://amazinglanka.com/wp/gal-massa/) මෙය විශාල ප්‍රමාණයේ ගල් පුවරු දෙකක් මත තැබූ තවත්ගල් පුවරුවකින් වසන ලද ස්මාරකයකි. මෙය දිගින් අඩි 10ක් ද පළලින් අඩි 6ක් ද වේ. ඉහළ ඇති ගල් පුවරුව 15*10 ප්‍රමාණයෙන් යුක්තය. මේ සඳහා දොරටුවක් ද තිබුණු බවට ද විශ්වාස කෙරේ. මෙම ගල් මැස්සට අමතරව පදවිගම්පල පිහිටා ඇති කඳු මුදුනේ ගල් ගුහා ද ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ඒවා ලෙස සැලකේ. කටාරම් කොටා ඇති මෙම ගල් ගුහා ඓතිහාසික යුගයේද වැදගත් වන්නට ඇතැයි සිතියහැකිය.

**පදවිගම්පල සංචාරක සත්කාරක නිවහන් ව්‍යාපෘතිය**

පදවිගම්පල සංචාරක සත්කාරක නිවහන් ව්‍යාපෘතිය ගම්මනයේ ක්‍රියාත්මක කිරීමට පියවර ගන්න ලද්දේ ගම නැගුම, ගැමි දිරිය වැඩසටහන් වලට අනුකූලවය. සබරගමුව පළාත් සභාව මූලිකත්වය ගෙන ක්‍රියාත්මක කරන ලද මා ඔය කලාප සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රජාමූලික සංවර්ධනය සඳහා අනුගත වැඩසටහන් වශයෙන් පදවිගම්පල සංචාරක සත්කාරක නිවහන් ගම්මාන ව්‍යාපෘතිය දියත් කරන ලදි. මෙම ව්‍යාපෘතිය නිර්මාණයේ කටයුතු සිදුවන්නේ සබරගමුව විශ්වවිද්‍යාලයේ නිරීක්ෂණය යටතේ ය. මෙය ප්‍රථම සංචාරක සත්කාරක නිවහන් ගම්මානය වශයෙන් සංචාරක ක්ෂේත්‍රයේ ඉතිහාසයට එක් වේ.

පදවිගම්පල පදනම නමින් ප්‍රජා සංවිධානයක් ග්‍රාමවාසීන් විසින් පවත්වාගෙන යනු ලබන අතර එහි සාමාජිකත්වය ලබගෙන මෙම සංචාරක සත්කාරක නිවහන් ව්‍යාපෘතියට එක්විය හැකිය. දැනට මෙම ව්‍යාපෘතිය සඳහා මෙම ගම්මනයේ ඇති නිවාස 20ක් ඉදිරිපත් වී තිබේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද අත්‍යාවශ අංග හා නියමිත තත්ත්ව තිබෙනවා නම් ඊට අනුමැතිය ලබාදෙනු ලැබේ.

මෙම සංචාරක නවාතැන් ව්‍යාපෘතිය සඳහා මුලින්ම අනුමත වූ නිවස වන්නේ මහගෙදර නමින් හඳුන්වනු ලබන නිවාසයයි. එහි නියමිත අංග හා අවශ්‍ය සාධක සපුරා ඇති බැවින් ඊට සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලැබී තිබේ. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී ඇති ආකාරයට ඉඩ පහසුකම් සහිත මනාව නඩත්තු කරන ලද ගෙවත්ත, මනාව නඩත්තු කරන ලද ගෘහ භාණ්ඩ සහිත නිවස හා එහි ඇතුළත සංචාරක නිවහනක් සඳහා අවශ්‍ය කරන ප්‍රධානම හා පළමු අවශ්‍යතා මෙහි සපුරා තිබේ.

එමෙන්ම නියමිත වර්ග අඩි ප්‍රමාණය සහිතව සැකසූ කාමරය ද එහි අනුමත ආකරයෙන් දී ඇති අනිකුත් අංග ද මෙහි දක්නට ලැබේ. මදුරු දැල්, විදුලි පංකා, ඝන තිරරෙදි, යතුරු දැමිය හැකි කුඩා අල්මාරිය, කණ්ණාඩි මේසය මෙහි දක්නට ලැබේ. කාමරයට ඈඳන ලද නාන කාමරය නියමිත වර්ග අඩි ප්‍රමාණය සහිතව සියලු පහසුකම් වලින් සමන්විතව නිමකර තිබේ. එමෙන්ම ප්‍රථමාධාර පහසුකම්, ගිනි නිවන වැලි බාල්දි, සංචාරක පැමිණීම් සටහන් පොත්, බිල් පොත් ආදිය මෙන්ම ඔවුන් ලද අනුමැති සහතික පත්‍රය ද ප්‍රදර්ශනය කරනු ලැබ තිබේ. ව්‍යාපෘතියට සම්බන්ධව තිබෙන අනිකුත් නිවාස ද මේ ආකරයෙන්ම නඩත්තු කරගෙන යාමට අවශ්‍ය කටයුතු අනුගමනය කරමින් සිටින අතර සබරගමු විශ්වවිද්‍යාලය මඟින් එහි අධීක්ෂණ කටයුතු කරගෙන යයි.



ජායාරූපය අංක 1 නිවහන හා ගෙවත්ත



ජායාරූපය අංක 2 නිවහන ඇතුළත



MHS Mahagedara Home Stay
Tourist Board Approval
A/C Rooms. Non A/C Rooms
Attach Bathroom, Hot water showers, Green Garden
E-mail: brkmbasnayaka66@gmail.com
Padavigampala,
Yatagama,
Rambukkna.
100
Tel : 035-2052222
Hot Line : 071-9264516
Date:..................20......
M/s..................................

ජායාරූපය අංක 3 බිල් පොත්



LICENCE TO CARRY ON BUSINESS AS A HOME STAY UNIT

ජායාරූපය අංක 4 අනුමැති සහතික පත්‍රය

සංචාරක සත්කාරක නිවහන් වලට අමතරව ගම්මනයේ තෝරාගත් ස්ථානයක ගොවි ගෙදර යනුවෙන් සාම්ප්‍රදායික වී බිස්සක් සහිතව නිර්මාණය කරන ලද නිවසක් ද ඉදි කර තිබේ. ඒ සංචාරකයා හට සාම්ප්‍රදායික ගැමි දිවියේ අත්දැකීම් ලබා දීම අරමුණු කරගනිමිනි. මීට අමතරව වෙද ගෙදර නමින් ද සාම්ප්‍රදායික ලෙසට අතීතයේ පැවති දේශීය වෙදකම නිරූපණය කෙරෙන්නාවූ නිවසක් ද නිර්මාණය කිරීමට සැලසුම් කරගෙන යයි.



**ඡායාරූපය අංක 5 ගොවි ගෙදර**

සංචාරකයන් හට මෙම සංචාරක සත්කාරක නිවහන් වල නැවතී ශ්‍රී ලාංකික දිවි පෙවෙත පිළිබඳව අත්දැකීම් ලබාගැනීමට හැකි අතර දේශීය ආහාර පාන භුක්ති විඳිමින්, ගැමි දිවියේ හා සම්ප්‍රදායන් වල සත්‍ය අත්දැකීම් ලබා ගනිමින්, ගැමියන් සමග කටයුතු කිරීමට හැකියාව ලැබේ.

**සංචාරකයන් හට අත්දැකීම් ලබා ගැනීම සඳහා නිරත විය හැකි ක්‍රියාකාරකම්**

පදවිගම්පල සංචාරක සත්කාරක නිවහනේ නවාතැන් ගන්නා සංචාරකයාට ශ්‍රී ලාංකික ගැමි දිවි පෙවෙත පිළිබඳව අත්දැකීම් ලබා ගැනීමට මෙම ගම්මනය අශ්‍රිත කරගෙන විවිධ සංචාරක ක්‍රියාකාරකම් වල නිරත වීමේ හැකියාව පවතී. විශේෂයෙන්ම මෙම ගම්මානය ත්‍රාසජනක හා ස්වාභාවික සංචරණය සඳහා ඉහළ විභවතාවයක් පෙන්වයි. ගම්මානය අවට ඇති කඳු තරණය කිරීම, වෙල්යායන් මැදින් වැටී ඇති මංමාවත් හරහා බයිසිකල් පැදීම, ගල්ගුහා නැරඹීම, කඹ යොදා ගල්ගුහා තරණය කිරීම වැනි ත්‍රසජනක අත්දැකීම් ලබා ගැනීමට සංචාරකයාට හැකියාව ලැබේ. එලෙසින්ම මෙම ගම්මානයේ ඇති කුඩා දිය දහරා, උල්පත් වලින් දිය නෑම හා මාළු බෑම වැනි ක්‍රියාකරකම් මෙන්ම ස්වාභාවික සෞන්දර්යෙන් අනූන බිම් පෙදෙසක් නිසා ස්වාභාවික මංපෙත් වල ඇවිදයාම, කුරුල්ලන් නැරඹීම වැනි ස්වාභාවික සංචරණයේ අංග වලට ද පදවිගම්පල ගම්මානයේ ඇත්තේ ඉහළ විභවතාවයකි. ස්වාභාවික පරිසරය අධ්‍යයනය කරන්නන්ට තෝතැන්නක් වන්වා මෙන්ම මෙම ප්‍රදේශය තුළ ඇති ගල් මැස්ස හා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් ගුහා ආදිය පුරාවිද්‍යාව, සංස්කෘතික සංචරණය පිළිබඳව කැමැත්තක් දක්වන සංචාරකයන්ට වැදගත් ස්ථාන වේ. ඊට අමතරව ග්‍රාමීය ජීවන රටාව අධ්‍යයනය කරන්නන්ට, ප්‍රජා සංචරණය පිළිබඳ උනන්දුවන සංචාරකයා හට ගම්මානයේ කෘෂිකාර්මික කටයුතු වලට, අත්කම් නිර්මාණය කරන් ස්ථාන වලට ගොස් සහභාගි වීමට හැකියාව ලැබේ. සංස්කෘතික නර්තන, චාරිත්‍රවාරිත්‍ර, සම්ප්‍රදායික ඇදහිලි ආදිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් ඒවාට සහභාගි වී අත්දැකීම් ලබා

ගැනීමටත් සංචාරකයාට හැකියාව ලැබේ. පදවිගම්පල ගම්මානය පිහිටා ඇති ස්ථානය අනුව ප්‍රදේශය අවට තිබෙන අතිකුත් විශේෂ සංචාරක ස්ථාන කරාද පහසුවෙන් ප්‍රවේශ වීමට සංචාරකයාට හැකිය.

**(1 වගුව) පදවිගම්පලට ආසන්නව පිහිටා ඇති සංචාරක ආකර්ශන හා ඒවාට ආසන්න දුර ප්‍රමාණ**

| ස්ථානය | දුර කිලෝමීටර් |
|---|---|
| පැරණි ගුහා සංකීර්ණය | ½ |
| දැලිවල කොට වෙහෙර | 4 |
| පින්නවල අලි අනාථාගාරය | 8 |
| පින්නවල නව සත්ත්වෝද්‍යානය | 8 |
| කඩිගමුව පැරණි විහාරය | 10 |
| උතුවන්කන්ද | 10 |
| බලන කපොල්ල | 15 |
| දෙවන දිගම දුම්රිය  උමංමග | 15 |
| මාවනැල්ල ඉපැරණි ගල් පාලම | 16 |
| මාවනැල්ල බෝ ඇල්ල | 16 |
| බතලේගල කන්ද | 16 |

මූලාශ්‍රය:- Ma Oya zone development master plan, 2012

**සංචාරක සත්කාරක නිවහන් ගම්මාන ව්‍යාපෘතියේ ප්‍රතිලාභ**

මෙම සංචාරක සත්කාරක නිවහන් ව්‍යාපෘතියෙන් ඇතිවන ප්‍රතිලාභ ආර්ථික, සමාජ හා සංස්කෘතික, පාරිසරික යන අංශ ත්‍රිත්වය යටතේ වර්ග කර විග්‍රහ කළ හැකිය. මින් ලැබෙන්නාවූ ප්‍රතිලාභයන් බොහෝමයකි.

- **ආර්ථික ප්‍රතිලාභ**

ප්‍රජා සංචරණය මූලික වශයෙන්ම අරමුණු කරගනු ලබන්නේ ග්‍රාමීය ප්‍රජාව සංචාරක කර්මාන්තය සඳහා සම්බන්ධ කරගෙන ඔවුන්ට ඍජු ආර්ථික ප්‍රතිලාභ ලබා දීමය. මෙම ගම්මානය තුළ ජනතාවට ද බොහෝ ආර්ථික ප්‍රතිලාභ ලඟා කරගැනීමට හැකියාව ලැබේ. සංචාරකයන්ට තම නිවාස වල නවාතැන් දීම මඟින් පමණක් නොව ඔවුන්ගේ ස්වයං රැකියාවල නිෂ්පාදන ආදිය සංචාරකයා මිලදී ගැනීම හේතු කරගෙන ග්‍රාමීය ප්‍රජාවට ආදායම් උපදවා ගැනීමට හැකියාවක් ලැබේ.

ගම්මානය ආශ්‍රිත ප්‍රජාවට සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ රැකියාවල නිරත වීමට අවස්ථාව මින් නිර්මාණය වේ. ගම්මානයට පැමිණෙන සංචාරකයන් හට මාර්ගෝපදේශන ආදී කටයුතු වලට සම්බන්ධ වීමට ගමේ තරුණ ප්‍රජාවට හැකියාව ලැබීම උදාහරණයක්

වශයෙන් දැක්විය හැකිය. එය ඔවුන්ට අනාගතයේ දී මේ ක්ෂේත්‍රය තුළ ඉහළටම යාමට අවස්ථාව ලබා දීමකි.

ප්‍රජා සංවර්ධනය සඳහා වූ අරමුදල් ඉහළයාම ද ප්‍රජා මූලික සංචරණයේ මූලික ප්‍රතිලාභයකි. පදවිගම්පල පදනම නම් වූ මෙම ගම්මානයේ පවතින සංවිධානයට අරමුදල් ලැබීම මේ හරහා සිදුවන අතර ඉන් එම පදනම ශක්තිමත්ව ගොඩනගා ගැනීමට හැකියාව ලැබේ.

සංචාරකයා ඔවුන්ගේ දේශීය නිෂ්පාදන, ස්වයං රැකියා වලින් නිෂ්පාදනය කරන දෑ මිළදී ගැනීම මගින් ඒවා සඳහා ද හොඳ වෙළඳපලක් නිර්මාණය වීමද ආර්ථික වශයෙන් ලැබෙන ප්‍රතිලාභයකි. ග්‍රාමීය වශයෙන් ආර්ථික තත්ත්වයේ ඇතිවන වෙනස්වීම් රටේ සමස්ත ආර්ථික තත්ත්වය කෙරේද බලපානු ලැබේ.

සංචාරකයා පැමිණීමත් සමගම ප්‍රදේශය තුළ මාර්ග පද්ධතිය, සන්නිවේදන පහසුකම්, ජල හා විදුලිය වැනි යටිතල පහසුකම් සංවර්ධනය වන අතර එසේ සිදුවන ප්‍රදේශීය සංවර්ධනය ග්‍රාමීය ජනතාවට ද යොදාගත හැකි නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස්වීමට ද වැදගත් වේ.

- **සමාජ ආර්ථික ප්‍රතිලාභ**

මෙම සත්කාරක නිවහන් සංකල්පය හේතු කොට ගෙන ප්‍රදේශයේ ඇතිවන සමාජ සංස්කෘතික ප්‍රතිලාභ බොහෝමයකි. ඉන් ප්‍රධානතම ප්‍රතිලාභය වන්නේ ප්‍රජා සංවර්ධනයයි. මෙහිදී සංචාරක කර්මාන්තයේ තීරණ ගැනීම් වලට, කළමනාකරණයට හා පාලනයට ජනතාවගේ ඍජු යොමුවීම සිදුවේ. එහි දී වයස් භේදයකින් තොරව වගකීම් දැරීමට, කටයුතු කිරීමට ප්‍රජාව යොමුවේ. ක්‍රියාකාරි ප්‍රජා සහභාගීත්වය ඔවුන්ගේ ජීවිතයේ ගුණාත්මක බවට හේතුවක් වේ.ගම්මානයේ නිවාස වල සංචාරකයන් නවත්වා ගැනීමට ඉහළ තත්ත්වයකින් යුක්තව නිවාස නිර්මාණය කරනු ලබන නිසා එහි නිවැසියන්ට ද ඉන් ලැබෙන්නේ ඉහළ ප්‍රතිලාභයකි. නිවාස වල තත්ත්වය ඉහළයාම මගින් සුව පහසු දිවියක් ගත කිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රජාවට නිතැනින්ම උදාවේ.

විදේශීය සංචාරකයන් සමඟ කටයුතු කිරීමට සිදුවන බැවින් ඔවුන් සමඟ දෛනිකව කටයුතු කිරීමට ද සිදුවීමේදී භාෂාව ඉතා වැදගත්ය. මෙහිදී නිරතුරුව සංචාරකයන් සමඟ ගනුදෙනු කිරීම නිසා ප්‍රජාවගේ භාෂා ඥාණය දියුණු වීම ඉහළ සමාජ ප්‍රතිලාභයකි. ඉංග්‍රීසි මෙන්ම වෙනත් භාෂා ඉගනගැනීමට මෙහි දී අවස්ථාව ලැබේ.

සංචාරක නිවහන් ව්‍යාපෘතිය තුළ දී සිදුවන්නේ වෙනත් සංස්කෘතියක පිරිසක් සමඟ මුසුවීමයි. මෙහිදී සිදුවන සංස්කෘතික හුවමාරුව මෙන්ම අන්‍ය සංස්කෘතීන්වලට ගරු කිරීමද නිතැනින්ම සිදුවේ. ශ්‍රී ලාංකික සංස්කෘතිය හා අනන්‍යතාව පිළිබඳ අභිමානය හා ප්‍රෞඪත්වය වර්ධනය වීම මෙන්ම එහි දැනීම වෙනත් රටවල්කරා ද ගමන් කිරීමට මෙහිදී මඟ පාදනු ලබයි. මෙම සංකල්පය තුළ දී දේශීය සංස්කෘතිය පිළිබඳ වැඩි අවධානය යොමු කෙරෙන බැවින් සංස්කෘතික සංරක්ෂණය නිතැනින්ම සිදුවේ. උදාහරණ වශයෙන් දේශීය කර්මාන්ත,

ඇදහිලි විශ්වාස සම්ප්‍රදායන්, නර්තන කලා, ඉහුම් පිහුම් ක්‍රම ආදිය දැක්විය හැකිය. වර්තමානයේ දී මෙවා භාවිතා වීම් අනාගත පරපුරට ද මෙම සංස්කෘතිය සම්ප්‍රේෂණය වීමට හේතුවක් වේ.

- **පාරිසරික ප්‍රතිලාභ**

ප්‍රජා මූලික සංචරණය තුළ දී පාරිසරික අංශය කෙරේ ද වැඩි අවධානයක් යොමු වේ. පාරිසරික වශයෙන් ගත් කළ මෙම සංචාරක සත්කාරක නිවහන් වැඩසටහන්, පාරිසරික වගකීම, ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා පරිසරය පිළිබඳව දැනුවත් බව ඉහළ යාමට රුකුලකි. සංචාරකයා පැමිණ බයිසිකල් පැදීම, කඳු නැගීම, කුරුල්ලන් නැරඹීම වැනි සංචාරක ක්‍රියාකරකම් වල නිරත වන නිසා ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීමට ග්‍රාමීය ප්‍රජාව කටයුතු කරයි. ඉන් පාරිසරික සුරක්ෂිත බව තහවුරු වේ. මෙහිදී සංචාරකයා ද වගකීම් සහිතව කරනු ලබන සංචාරණයක් නිසා අයහපත් ප්‍රතිඵල බෙහෙවින් අඩු අතර පරිසරයේ ආරක්ෂාවට එය උපකාරී වේ.

**ප්‍රවර්ධන යෝජනා**

මෙම සංචාරක සත්කාරක නිවහන් සංකල්පය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට මෙහිදී යෝජනා ඉදිරිපත් කෙරේ. මින් ග්‍රාමීය ප්‍රජාවට වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට, ඔවුන් තවදුරටත් ධෛර්යමත් කිරීමට, සංචාරකයාට වඩා හොඳ සේවාවක් ලබා දීමට හා තව දුරටත් මෙම සංකල්පය සංවර්ධනය කිරීමට උපකාරි වනු ඇත.

ප්‍රධාන වශයෙන්ම මෙම සංකල්පය තව දුරටත් ගුණාත්මක බවින් වැඩිකර ගැනීමට නම් පෞද්ගලික අංශයේ මැදිහත් වීම ලබා ගැනීම ද සිදු කල යුතුය. පෞද්ගලික අංශයේ මැදිහත් වීම අවශ්‍ය වන්නේ කිනම් ස්ථාන වලටද සොයා බලා රාජ්‍ය අංශය විසින් ඔවුන්ට සහයෝගය ලබා දියයුතුය. විශේෂයෙන්ම සංචාරක ක්‍රියාකාරකම් හා සේවා සැපයීම උදෙසා පෞද්ගලික අංශයට ඉඩ ලබා දීම මඟින් යහපත් ප්‍රතිඵල ලඟා කරගත හැකිය.

පදවිගම්පල අශ්‍රිතව ගල්ගුහා විශාල ප්‍රමාණයක් දක්නට ලැබෙන බැවින් ඒ ආශ්‍රිතව කඳවුරු බැඳීම වැනි නව ක්‍රියාකාරකම් හඳුන්වා දීමට හැකියාව පවතී.

සංචාරක සත්කාරක නිවාස පවත්වාගෙන යන පවුල්හට අලුත් අවස්ථාව ලබා දීම මගින් ඔවුන් තවත් දිරිමත් වේ. උදාහරණ වශයෙන් හොඳම සත්කාරක නිවාසයට සම්මාන සහතික ආදිය ලබා දී ඇගයීම් කටයුතු කිරීම මඟින් ඔවුන් තවත් දිරිමත්වනවා පමණක් නොව වඩා ගුණාත්මක සේවාවක් සංචාරකයාට ලබා දිය හැකිය.

පදවිගම්පල ගම්මානයේ වැසියන් ඔවුන්ගේ දෛනික පරිභෝජනය උදෙසා එළවලු පලතුරු ආදිය වගා කරයි. මෙම කොරටු වෙත සංචාරකයා ගෙන ගොස් ඔවුන්ටම ඒවා නෙලා ගැනීමට හා සකසා ගනීමට සැලැස්විය හැකිය. විදේශ රටවල කෘෂි සංචරණය , ග්‍රාමීය සංචරණය වැනි සංකල්ප තුළ මෙම අංගය ක්‍රියාත්මක වේ. U Pick Up System නමින් හඳුන්වන මෙම ක්‍රමවේදය සංචාරකයාට නවමු අත්දැකීමක් ලබා දීමට සමත් වේ. ඊට

අමතරව මාළු බෑමෙන් පසු ඔවුන්ටම ඒවා ආහරයට සකස් කරගැනීමට ඉඩ සලසා දීම, කිරි දෙවීම් වැනි කටයුතු වලට සම්බන්ධ කර ගැනීම, වගාබිම්වල පැල් ඉදිකර එම අත්දැකීම් ලබා ගැනීමට සංචාරකයාට ඉඩ ලබා දිය හැකිය.

දේශීය වෙදකම හා සම්බන්ධ දේශීය ආයුර්වේද ප්‍රතිකාර ලබා දෙන ස්ථානයක්, භාවනා කටයුතු සිදු කිරීමේ වැඩසටහන් සංචාරකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමද පදවිගම්පල ආශ්‍රිතව ක්‍රියාත්මක කළ හැකිය. අයුර්වේද සංචරණය(Ayurvedic Tourism) හා අධ්‍යාත්මික සංචරණය (Spiritual Tourism) යන සංකල්ප ද මෙයට සමගාමීව ක්‍රියාත්මක කළ හැකිය.

මෙම ප්‍රදේශයට තොරතුරු මධ්‍යස්ථානයක් ඉතාමත් අවශ්‍ය වේ. ඊට අමතරව පහසුකම් මධ්‍යස්ථානයක් ද ස්ථාපනය කළ යුතුය. අන්තර්ජාල, ඊමේල්, ෆැක්ස්, දුරකථන පහසුකම් සහිතව ගම්මානයට එක් පහසුකම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම මෙම ගම්මානයට පැමිණෙන සංචාරක ප්‍රජාවට විශාල පහසුවක් සපයයි.

සංචාරකයා ගම්මනයට ඇතුළු වීමට පෙර ගමේ ප්‍රජා ශාලාව වැනි ස්ථානයකට කැඳවා ඔවුන්ව ප්‍රථමයෙන් දැනුවත් කිරීම මගින් මතුවන ගැටලුකාරී තත්ත්ව අවම කිරීමට මෙන්ම ප්‍රජාව හා සංචාරකයා අතර මනා සම්බන්ධතාවක් ඇති කිරීමට සමත් වේ. සංචාරකයා පමණක් නොව නිරතුරුව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්, අධීක්ෂණයන්, වැඩමුළු පැවැත්වීම ආදිය වගකිවයුතු ආයතන විසින් සිදුකළ යුතු අතර නිරතුරුව ඔවුන්ට මග පෙන්වීමද කළ යුතුය. ඉන් මේ ආශ්‍රිතව ඇතිවන ගැටලු අවම කර ගත හැකිය.

සෑම විටම කුඩා පිරිසක් ගමට යැවීම වැදගත් ය. එක්වර විශාල පිරිසක් ගමට යාම හානිකර තත්ත්ව උදා කරයි. එය රඳවා ගැනීමේ ධාරිතාවට ගැටලුවකි. අයහපත් ප්‍රතිඵල මේ මගින් වලක්වා ගත හැකිය. එමෙන්ම සංචාරක සත්කාරක වැඩසටහන වඩා සර්ථක කරගැනීම උදෙසා භාෂා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් ය.

සෑමවිටම ව්‍යාපෘතිය පිළිබඳව සමාලෝචනය, පසු විපරම යන ක්‍රියාවලි ඉතා වැදගත් වන අතර එවිට කිනම් හෝ දුර්වලතාවක්, ගැටලුවක් මතුවනවා නම් ඒවාට පිළියම් යොදා සුදුසු ක්‍රියාමාර්ග ගෙන සාර්ථක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ඒ මගින් මග පෙන්වයි.

මෙම ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රවර්ධන කටයුතු වලට වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ. අන්තර්ජාලය මගින් ප්‍රවර්ධනය මෙන්ම දේශීය ජනතාවටද අවබෝධය ලබා ගැනීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වලින් ප්‍රවර්ධන කටයුතු කිරීමද කළ යුතුය.

මෙම ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් වඩා හොඳ ගුණාත්මක සේවාවක් සංචාරකයාට ලබාදීමට මෙන්ම ප්‍රජාවට සෘජු ප්‍රතිලාභ ලබා ගැනීමට ද ඉන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සහයෝගය ලබා දීමට මෙම සංචාරක සත්කාරක ව්‍යාපෘතිය මගින් හැකියාව ලැබේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

*Maoya Zone Development Master Plan (2009-2014)*, Minisrty of Provincial Roads Development Rural Infrastructure and Tourism, Sabaragamuwa Provincial Council, Rathnapura.

*Registration Guide line for Home Stay Accomadation Scheme* (2013), Sri Lanka Tourism Dvelopment Authority, Colombo.

http://www.sltda.lk/home_stay_project

http://www.sarvodaya.org/activities/community-tourism/what-is-community-tourism

http://amazinglanka.com/wp/gal-massa/

**සම්මුඛ සාකච්ඡා**

අසංගිකා කුමාරි, සංවර්ධන නිළධාරී/සංචාරක අංශය,සබරගමු පළාත් සභාව, රත්නපුර. (2014/08/13)

එම්.එච්. ලොකුබණ්ඩා, භාරකරු, ගොවි ගෙදර සංචාරක සත්කාරක නිවහන, පදවිගම්පල. (2014/10/16)

කේ.එම්.පී.ඩී කරුණානායක, ආර්ථික සංවර්ධන නිලධාරී, පදවිගම්පල. (2014/10/09 හා 2014/10/16)

බණ්ඩාර දිසානායක, ග්‍රාම නිලධාරී, පදවිගම්පල 5 ඒ වසම,පදවිගම්පල. (2014/10/09 හා 2014/10/16)

මහින්ද බස්නායක, භාරකරු, මහ ගෙදර සංචාරක සත්කාරක නිවහන, පදවිගම්පල.(2014/10/16)